

නීලම්මහර පුරාණ විහාරයේ සෑ රදුන්ගේ කොත නිරාවරණය

## ඔබ ඔබගේ ම සතුරකු වන හැටි

– හැවනේ සාරානන්ද හිමි

ජීවිත අවබෝධයෙන් තොර වූ පුද්ගලයා කටුක පල දෙන පාප ක්‍රියාවල යෙදෙමින් තමන්ටම සතුරකු සේ හැසිරෙන බව සඳහන් වන බුද්ධ දේශනාවකට අර්ථකථනයක් – මැදින් පුර අටවක පෝද ධර්ම දේශනාවෙන්

## දියුණුවේ රහස්

– ලසන්ත සමීර ඒකනායක

ලෞකික ජීවිතයේ දියුණුවට හේතුවන සිරිත් හා පිළිවෙත්. කර්ම නියාමය නමැති බුද්ධ දේශනාවෙහි ඇතුළත් ලෝක යථාර්ථය – නූතන මනෝ විද්‍යාඥයන් විසින් යම් තරමකට වටහාගෙන ඇති බව තහවුරු වන බටහිර මනෝ විද්‍යාවේ දැක්වෙන සාර්ථකත්වය පිළි–බඳ අදහස් මෙම ලිපියට ඇතුළත්ය.

## ගණක මොග්ගල්ලාන සූත්‍රයෙන් දැක්වෙන නිවන් මග අනුපිළිවෙළ

බුද්ධ දේශනාව අනුව; හේතු–ඵල වශයෙන් සකස් වී ඇති සසර පැවැත්ම අවසන් කළ හැක්කේ – ක්‍රම ක්‍රමයෙන් ඊට අදාළ හේතු ඉවත් කිරීම මගින් පමණි. ඒ අනුව විමුක්ති මග අනුපිළිවෙළ පිළිබඳ ඉදිරිපත් වූ බුද්ධ දේශනාවකට අර්ථකථනයකි මෙම ලිපිය.

## නාරම්මල ශ්‍රී සීලවතී මහ පිරිවෙන් විහාරය

“වෙහෙර විහාර” විශේෂාංගය යටතේ කුරුණෑගල නාරම්මල ප්‍රදේශයේ පිහිටි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. එම විහාරස්–ථානයෙන් සිදු කැරෙන අධ්‍යාපනික මෙහෙවර පිළිබඳ තොරතුරු ද මෙම ලිපියට ඇතුළත්ය.

## දානය

– ඒ. එම්. ප්‍රේමරත්න

‘දානය’ නමැති බෞද්ධ විමුක්ති ප්‍රතිපදාවට අයත් සත් පිළිවෙත තුළින් පුද්ගලයා සසර බැඳ තබන තණ්හා බැමි ලිහිල් වන ආකා–රය මනෝ විද්‍යාත්මක ලෙස පහදා දීමට කරන උත්සාහයකි.

## හෙට දවස ලස්සණ කරන දියුණුවේ දොරටු

– ගොඩගම චන්ද්‍රදස්සී සිල් මාතාව විසිනි

දියුණුව පිළිබඳ වැඩි උනන්දුවක් ඇති යුගයක බුදු දහමෙහි දැක්–වෙන ‘දියුණුවේ දොරටු’ පිළිබඳ විග්‍රහ කැරෙන ලිපියකි.

## ජාතක කතා නිරූපිත භාරත මූර්ති

‘බෞද්ධ කලා නිර්මාණ’ විශේෂාංගය යටතේ භාරත දේශයේ භාරුත් බෞද්ධ කලා මධ්‍යස්ථානයෙහි පිහිටා ඇති බෞද්ධ කතා ඇසුරෙන් නිරූපිත මූර්ති හා කැටයම් පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි.

## පෞරුෂ වර්ධනයට බුදු දහමෙන් පාඩම්

– දයා රෝහණ අතුකෝරළ

බුද්ධ දේශනාව තුළ සඳහන් වන විමුක්ති මගෙහි ගමන් කිරීමේදී පුද්ගල පෞරුෂය සංවර්ධනය වන ආකාරය. පෞරුෂ වර්ධනය සඳහා බුදු ඔවදන් තුළින් ලද හැකි පාඩම්.

## 'Kamma' - action volitional

***-by Aryadasa Ratnasinghe*** *"Cetanaham bhikkhave kammam vadami, Cetaitva kammam karothi kayena vacaya manasa".*